www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ෆැසිස්ට්වාදය හා මහ යුදෙව් සංහාරය

## ඩැනියෙල් ගෝල්ඩ්හාගන්ගේ *Hitler's Willing Executioners* (හිට්ලර්ගේ ආසක්ත අලුගෝසුවෝ) කෘතිය පිලිබඳ විවේචනාත්මක විචාරයක්

**Fascism & the Holocaust**
**A critical review of Daniel Goldhagen's Hitler's Willing Executioners**

*පහත පලවන්නේ එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් 1997 අප්‍රේල් 17 දා නැගෙනහිර ලැන්සිග් හි මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ දී පැවැත් වූ දේශනයකි. 1997 මැයි 30 කම්කරු මාවත පුවත්පතේ පලවූ ලිපිය කොටස් හතරකින් මෙහි පලකරමු.*

### සිව් වන කොටස

### සාමකාමී විප්ලවයක් ?

ගෝල්ඩ්හාගන් තම පොතේ අවසානයේ මෙසේ ලියයිඃ "නාසි ජර්මානු විප්ලවය...... අසාමාන්‍ය විප්ලවයක් විය. මන්ද යත් සිය රට තුල, එය සාක්ෂාත් කරගනු ලැබුවේ - ප්‍රථම අවුරුදුවල දී දේශපාලන වම මර්දනය කිරීම කල නමුත් - දැවැන්ත පරිපීඩනයකින් හා ප්‍රචන්ඩත්වයකින් තොරව ය.......... පලල් වශයෙන් ගත හොත් එය ජර්මානු ජනතාව සිය කැමත්තෙන් සහභාගී වූ සාමකාමී විප්ලවයක් විය. ස්වදේශිකව ගත හොත් නාසි ජර්මානු විප්ලවය, සමස්ත වශයෙන් සම්මතික විය."(456 පි.)

මෙම වචන කියවන තෙක්, මා ගෝල්ඩ්හාගන් දෙස බැලීමට යොමු වී සිටියේ බොහෝ දුරට ශෝකයට පත් සහ තරමක් දුරට ශෝකජනක පුද්ලගයෙකු ලෙස ය; යුරෝපයේ යුදෙව් ජනයාගේ ඉරනම හැදෑරීම නිසා, මානසික වශයෙන් නුවුවත්, බුද්ධිමය වශයෙන්, දරුනු වේදනාවට පත් තරුන මිනිසෙකු ලෙස ය. එහෙත් මෙම ඡේදයේ ඉතා කැත දෙයක් ඉස්මතු වේඃ යුදෙව්වන්ට සැලකූ ආකාරය නො වන්නට නාසි " විප්ලවය" - ගෝල්ඩ්හාගන් "ප්‍රතිවිප්ලවය" යන වචනය නො යොදයි - සාමාන්‍යයෙන් යහපත් එකක් විය. " දේශපාලන වම මර්දනය කිරීම" යන වචන ඔහු ඉදිරිපත් කරන්නේ කෙටි ඉරි දෙකකට මැදි කර ගෙන ය. ඉන් ඔහු අඟවන්නේ එය එතරම් ගනන් ගත යුතු දෙයක් නො වන බවය.

නාසීන් බලය අත් කර ගැනීම "ජර්මානු ජනතාව සිය කැමැත්තෙන් එකඟ වූ සාමකාමී විප්ලවයක් ය" යන්න තුච්ඡ මුසාකරනයකි. "දේශපාලන මර්දනය කිරීම" යනුවෙන් ගෝල්ඩ්හාගන් විසින් හඳුන්වනු ලබන්නේ ඇත්ත වශයෙන් ම දස ලක්ෂ ගනන් කම්කරුවන්ගේ ද ජර්මානු බද්ධිමතුන් අතර හොඳ ම කොටස්වල ද වඩා හොඳ හා සාධාරන ලෝකයක් සඳහා බලාපොරොත්තු හා ප්‍රාර්ථනා නියෝජනය කල මහා සමාජවාදී පක්ෂ ශාරීරිකව විනාශ කර දැමීම ය. ජර්මානු සමාජවාදය දේශපාලන ව්‍යාපාරයක් පමනක් වුයේ නැතඃ එය, එහි අභ්‍යන්තර පරස්පරයන් කුමක් වුවත් මානව බුද්ධියේ හා සංස්කෘතියේ අති විශේෂ මල්පල ගැන්වීමක උත්තේජකයා හා ප්‍රකාශනය ද විය. එය විනාශ කිරීමට නාසීන්ට අති දක්ෂ වූ, මෘග විධික්‍රම අවශ්‍ය විය.

පොත් පුලුස්සා දැමීම, විද්‍යාඥයන්, කලාකරුවන් හා ලේඛකයන් ජර්මනියෙන් පලා යාම, ඩචෝ වධක කඳවුර පිහිටු වීම, සහ දහස් ගනන් වාමාංශික දේශපාලන විරුද්ධවාදීන් සිර කිරීම, ජාතික සමාජවාදීන් (නාසීන්) හැරෙන්නට අන් සියලු දේශපාලන පක්ෂ නීති විරෝධී කිරීම, වෘත්තීය සමිති කුඩුකර දැමීම - යන මේවා වනාහි නාසි පාලන තන්ත්‍රයේ ප්‍රථම මාස කීපය තුල ම අත් කර ගන්නා ලද "සාමකාමී විප්ලවය" යි.

නාසීන් විසින් මුදා හරින ලද ත්‍රස්තය තිබිය දී ම නිරන්තර හා සැලකිය යුතු විරුද්ධත්වයක් පැන නැංගේ ය.

"සමාජ ප්‍රජාතන්ත්‍රවාදින්ගෙන් හා කොමියුනිස්ට්වාදින්ගෙන් සැලකිය යුතු සුලුතරයක්", එෆ්.එල්. කාර්ස්ටර් ලියන පරිදි "දන ගැසීමට හෝ නව පාලන තන්ත්‍රය ඔවුන්ට නියම කරන ඕනෑම දෙයක් අකර්මන්‍යව පිලිගැනීමට හෝ කැමති නො වූහ. 'බලය අල්ලා ගැනීම' සමග ම ආ මුල් මාසවල දී සිදු කරන ලද මහා පරිමාන අත් අඩංගුවට ගැනීම් හා පැතිරී ගිය ත්‍රස්තය ඔවුන් ඇති තරම් ඒත්තු ගැන්වී ය. විශාල සංඛ්‍යාවක්, රහසිගත කන්ඩායම් තනමින් ද රහසිගත පත්‍රිකා හා පුවත් පත් බෙදා හරිමින් ද තමන්ට හැකි තරම් නාසි ප්‍රචාරයට බාධා කරමින් ද ප්‍රතිචාර දැක් වූහ. 1933 හා 1934 ඇතුලත ජර්මනිය පුරා රහසිගත

කන්ඩායම් පැන නැංගේ ය. - ඒවා බොහෝ විට එතරම් ම ඉක්මනින් ම ගෙස්ටාපෝව විසින් විනාශ කර දමන ලදී. 1933-1935 අවුරුදුවල දී ජර්මානු කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන් 75,000 නැති වී ගිය බව තක්සේරු කර තිබේ. ඉන් ගනනාවක් ම සිර ගත කරන ලද අතර තවත් දහස් ගනනක් මරා දමනු ලැබූහ. එහි අර්ථය නම් 1934 දී පක්ෂයට බඳවා ගනු ලැබුවන් අතර හතරෙන් පංගුවක් ම මරා දමනු ලැබූ බව ය. "(14)

නාසි ත්‍රන්තය දස ලක්ෂ ගනන් ජර්මානු ජනතාව භීතියට පත් කොට යටත් කලේ ය. තම සංවිධානවල නිර්ලජ්ජිත යටත් විම නිසා සිත් කලකිරුනු අපේක්ෂා භංග වූ කම්කරු පන්තියේ විශාල කොටස් උකටලී බවට පසු බැස ගියහ. එහෙත් නාසීන්ගේ නිර්දය මෘගත්වයට මුහුන දී වුව, ඔවුන්ගේ පාලන තන්ත්‍රයට එරෙහිව සැලකිය යුතු ක්‍රියාත්මක විරුද්ධත්වයක් කම්කරුවන් අතර පැන නැංගේ ය.

"කම්කරුවන්ගෙන් වැඩි දෙනා නාසි තන්ත්‍රය සමග සාමයට එලඹුනත්," කාර්ස්ටන් පැහැදිලි කරන පරිදි, "දේශපාලන කරුනු උඩ සිර ගත කරනු ලැබුවන්ගෙන් වැඩි දෙනා කම්කරු පන්තියට අයත් වූහ. ඩෝර්ට්මුන්ඩ් ප්‍රදේශයේ ස්ටෙයින්වාෂ්හි සිර ගත කරන ලද ජර්මානු ජාතිකයන් 21,823 කින් අති මහත් වැඩි සංඛ්‍යාව කම්කරුවෝ වූහ. දේශපාලන විරුද්ධ පාර්ශවය සමග එක් වූ සොලින්ජන් නගරයේ මිනිසුන් 629 කින් සියයට 70 ක් ම කම්කරුවන් වූ අතර අල්ලා ගන්නා ලද ගෘහනීන්ගෙන් 49 න් වැඩි ගනන කම්කරු පන්තික වූහ. රූර් දිස්ත්‍රික්කයේ ඔබර්හෝසන්හි මෙය සියයට 90 ට ආසන්න විය. අඩුවෙන් කාර්මික වූ ප්‍රදේශවල මෙම සංඛ්‍යාව තරමක් අඩු වීම පුදුමයක් නො වේ; එහෙත් දේශපාලන විශ්වාස නිසා මර්දනයට මුහුන දුන් අය අතුරෙන් වැඩි කොටස සත්තකින් ම ජර්මානු කම්කරු පන්තියට අයත් වූහ. 1933 සිට 1944 දක්වා අවුරුදුවල වාමාංශික කටයුතු නිසා එසෙන් ප්‍රදේශය තුල දී අත් අඩංගුවට ගනු ලැබූ සංඛ්‍යාව 2,162 කි; ඩසල්ඩෝර්ෆ්හි 1,721 කි. ඉන් 297 ක් ස්ත්‍රීහු වූහ. බ්‍රැන්ඩන්බර්ග් බන්ධනාගාරය තුල යුද සමයේ දී දේශපාලන හේතු නිසා මරා දමනු ලැබූ 1,807 දෙනාගෙන් 775 ක් කම්කරුවෝ හෝ හස්ත කර්මාන්තකරුවෝ වූහ. එය සාඩම්බර වාර්තාවක් විය. පාලන තන්ත්‍රය පෙරලා දැමීම ඔවුන්ට කල නො හැකි විය. එහෙත් එය කල හැකි කටයුත්තක් වූයේ ද නැත. 1944 දී මේ සඳහා මිලිටරි හා තත්වාරක්ෂක (කොන්සර්වටිව්) කොටස් විසින් යත්න දරුනු කල්හි ඔවුහු ද එසේ ම පරාජය කරනු ලැබූහ. පාලන තන්ත්‍රය අන්තිමේ දී බිඳ වැටුනේ යුද්ධ පරාජයකිනි. එසේ වූයේ ද තම විනාශය ඇති කරමිනි. අසම්බන්ධිත විපක්ෂය ඒකාධිපතිත්වයට කරදරකාරී දෙයක් වුවා පමනි. - එහෙත් අනෙකුත් සුලු කන්ඩායම් මෙන් ම - එය ද නිර්දයව මර්දනය කරනු ලැබී ය."(15)

*හිට්ලර්ගේ ආසනක්ත අලුගෝසුවෝ* නම් කෘතියේ මෙවන් කරුනු ඇතුලත් කර නැත. යුදෙව්වන් හැර අන් කවරෙකු මත හෝ ෆැසිස්ට්වාදය බලපෑ ආකාරය පිලිබඳව ඔහු උනන්දු නැති ය යන හැඟීමක් ගෝල්ඩ්හාගන්ගේ කෘතියෙන් ඇති වේ. මෙම දූෂ්‍ය නො තැකීම ගලා එන්නේ ඔහුගේ පටු හා කලකිරුනු දෘෂ්ටියෙනිඃ හොලෝකෝස්ටය වනාහී "සාමාන්‍ය" ජර්මානුන් විසින් යුදෙව්වන්ට එරෙහිව කරන ලද අපරාධයක් ය යන ඔහුගේ පටු සංකල්පයෙනි. ජර්මානුවන් ඔවුනොවුනට කරගත් දේ ගැන ඔහුගේ උන්න්දුවක් නැත. කෙසේ වෙතත් ජර්මානුවන් අතර ම හිට්ලර්ට සැලකිය යුතු විරුද්ධත්වයක් තිබුනේ ය යන මතයට ඔහුගේ ප්‍රමාදය ඉඩ තබන්නේ නැත.

මෙය කාරනාවක්, ලෙස සාවද්‍ය වනවා පමනක් නො වේ. මහාචාර්ය ගෝල්ඩ්හාගන්ගේ ආස්ථානයේ උත්ප්‍රාසය නම්, හොලෝකෝස්ටයේ හේතුව හෝ එහි සාර්වත්‍රික, ලෝක ඓතිහාසික වැදගත්කම හෝ වටහා ගැනීමට එය ඉඩ නො දීම ය.

ඓතිහාසිකව පීඩාවට පත් කරනු ලැබූ ජනතාවක් ලෙස යුදෙව් ජනයාගේ ඉරනම ද, කම්කරු පන්තයේ ඉරනම ද ඛේදජනක ලෙස එකට බැඳී තිබුනි. ජර්මානු සමාජවාදී කම්කරු ව්‍යාපාරයේ බිඳ වැටීම යුරෝපීය යුදෙව් ජනයා විනාශ කර දැමීමට දොර හැදුනි. යුදෙව්වන්ගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ද ඇත්ත වශයෙන් ජීවත් වීමට ඔවුන්ට තිබුනු අයිතිය ද කම්කරු පන්තියේ දේශපාලන ශක්තිය මත රැඳී තිබුනි. මහා පරිමානව යුදෙව්වන් මැරීම ඇරඹුනේ 1933 දී නො වේ. මෙවන් මහා පරිමාන අපරාධයක් කිරීමට පෙර ජර්මානු සමාජයේ බුද්ධිමය වශයෙන් ප්‍රානභූත, ප්‍රගතිශීලී මානුෂික කොටස ත්‍රස්ත කර විනාශ කර දැමීමට නාසීන්ට සිදු විය.

අවසාන විග්‍රහයේ දී, හොලෝකෝස්ටය වනාහී කම්කරු පන්තිය ධනේශ්වර පාලනය පෙරලා දැමීමට අසමත් වීම සඳහා යුදෙව් ජනයා පමනක් නොව මුලු මහත් මනුෂ්‍ය වර්ගයා ම ගෙවූ වන්දිය යි.

මෙය වනාහි අමතක නො කටයුතු පාඩමකි. අප ජීවත් වන්නේ ධනේෂ්වරයේ පරස්පරයන් යලිත් වරක් පුපුරන සුලු පරිමාවකට පත්වෙමින් පවත්නා ලෝකයක ය. භූගෝලීය ධනවාදයේ උමතු ක්‍රියාකලාපය මහා ජනකායෝ විනාශයේ මුවවිටට ම තල්ලු කර දමා නිෂ්පාදන බලවේගයන්ගෙන් ඉවත් කර දමනු ලබති. සෑම යුරෝපීය රටක ම පාහේ අද විරැකියාව සියයට 10 ඉක්මවා සිටි. ලෝක ධනේශ්වර වෙලඳ පොලේ උමතුවට එරෙහි සැබෑ විකල්පයක් වර්ධනය නො කල කල්හි, ධනවාදයේ නොමග ගිය ගොදුරු දක්ෂිනාංශික ජනවංචකයන්ගේ විකාර දෙඩවිලිවලට විවෘත වෙති.

යුදෙව් විරෝධය යළිත් රුසියාව තුල වැඩී ඒම පිලිබඳ ලිපියක් *නිව්යෝක් ටයිම්ස්* පුවත් පත විසින් පල කරන ලද්දේ ඊයේ යඃ "1991 දී කොමියුනිස්ට්වාදය සහ සෝවියට් සංගමය බිඳ වැටීමත් සමග පැන නැගි මුල් උදුරන සමාජ හා ආර්ථික පෙරලිය විසින් අපේක්ෂා භංග කරනු ලැබුවා වූ ද ඉන් උපදින මැසිවිලි ගසා කන දේශපාලකයන් විසින් උසිගන්වනු ලැබුවා වූ ද බොහෝ මිනිස්සු සම්ප්‍රදායික දඬමීමා වන යුදෙව්වන් දෙසට හැරෙමින් සිටිති."

මෙවන් වර්ධනයන් විසින් ඉස්මතු කෙරෙන අන්තරායට එරෙහිව ගෝල්ඩ්හාගන්ගේ කෘතියේ වටිනාකම කුමක් ද?

ගැඹුරුවන ආර්ථික අර්බුදයේ හා විකලත්වයේ තතු තුල 1930 ගනන්වල දේශපාලන පාඩම් අති විශේෂ සමකාලීන වැදගත් කමක් දරා ගනු ඇත. හොලෝකෝස්ටයේ උල්පත් හා සැබෑ හේතු හදාරා උකාහා ගැනීම අවශ්‍ය වන්නේ එහෙයිනි.

**සමාප්තයි**

**අධෝසටහන්**

14. එෆ්.එල්. කාර්ස්ටන්, *The German Workers and Nazis* (ජර්මානු කම්කරුවෝ හා නාසීන්), (ඇල්ඩර්ෂොට්ඃ ස්කොලර් ප්‍රෙස්, 1995), 180 පි.

15. එම, 182 පි.

© www.wsws.org